කතිරයේ බලය
புள்ளடியின் பலம்
ISSN-2706-0047
වෙළුම 5 කලාපය 2 මැතිවරණ කොමිෂන් සභාව මැයි - අගෝස්තු 2021

# 2021 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය



**ශ්‍රීන් යාපා බොරලැස්ස**
සහකාර මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)

රටෙහි සුදුසුකම් සැපිරූ සියලු පුරවැසියන්ට ජාතිය, ආගම, භාෂාව, වර්ගය, කුලය, අධ්‍යාපනය, දේපළ හිමිකම, උපත, උපන් ස්ථානය, වත්පොහොසත්කම, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය ආදී කිසිදු විශේෂත්වයකින් තොරව පාලන බලයට හවුල්වීමේ අයිතිය හා ඒ සඳහා නියෝජිතයින් තෝරා පත්කර ගැනීමට ඇති අයිතිය ලබාගත හැකි වනුයේ සර්වජන ඡන්ද බලය මඟිනි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන ව්‍යවස්ථාව ප්‍රකාරව සර්වජන ඡන්දබලය සහතික කර ඇත.

*''පරමාධිපත්‍ය ජනතාව සතු බවත්, එය අන්සතු කළ නොහැකි බවත්, පැවරිය නොහැකි බවත්, එකී පරමාධිපත්‍ය යන්නට පාලන බලතල, මූලික අයිතිවාසිකම්, ඡන්ද බලය යන අංග ඇතුළත් වන බවත්'' එහි සඳහන් වේ.*

ඒ අනුව රටේ පුරවැසියන්ට ජනාධිපතිවරයා තෝරා ගැනීමේ ඡන්ද විමසීමක දී, පාර්ලිමේන්තු මහ මැතිවරණයක දී, ජනමත විචාරණයක දී, පළාත් සභා ඡන්ද විමසීමක දී හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක දී තම ඡන්ද බලය ක්‍රියාත්මක කළ හැකිය. ඉහත සඳහන් ඡන්ද විමසීම්වල දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පුරවැසියන් අදාළ ඡන්ද විමසීමේ දී වලංගුව පවත්නා ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිව සිටීම අනිවාර්යය වේ.

මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම කටයුතු සිදුකරනු ලබනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා 1980 අංක 44 දරණ ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ දැක්වෙන විධිවිධාන අනුව වේ.

## ඡන්දහිමියකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය කරනු ලබන මූලික සුදුසුකම්

- ශ්‍රී ලංකික පුරවැසියකු වීම.
- ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබන දිනය වන ජුනි මස 01 වන දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම. (ඒ අනුව 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට හැකියාව ඇත්තේ 2003.05.31 හෝ එදිනට පෙර උපන් තැනැත්තන්ටය.)
- ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචියට ඉල්ලුම් කරන ලිපිනයේ සාමාන්‍ය පදිංචිය තිබීම.

## ඡන්දහිමියකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා නුසුදුසුකම්

- බල පවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් බවට අධිකරණය මඟින් තීරණය වී තිබීම.
- අවුරුදු 02 ක සිරගත වීමට නියම වන වරදකට අධිකරණය මඟින් වරදකරුවකු වී මාස 06කේ හෝ ඊට වැඩි කාලයක් සිරගත වී සිටීම හෝ සිරගත වී සහ ඉන්පසු අවුරුදු 07ක කාලයක් ගත වී නොතිබීම.
- අල්ලස් චෝදනාවකට වරදකරු වී අවුරුදු 07ක කාලයක් ගත වී නොතිබීම.
- මැතිවරණ නීති උල්ලංඝනය කිරීම හේතුකොට ගෙන අධිකරණය විසින් වරදකරුවකු කර තිබීම.
- මහජන ආයතන දූෂණ වැලැක්වීමේ ආඥා පනත යටතේ වරදකරුවකු වී තිබීම.

## 2021 වර්ෂයේ ඡන්දහිමි නාම ලේඛනය ප්‍රතිශෝධනය කරනු ලබන ආකාරය.

සෑම වසරකම ජුනි මස 01 දින සිට ඡන්දහිමි නාමලේඛනය ප්‍රතිශෝධනය කිරීම ආරම්භ වේ. මෙම කාර්යය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මඟින් සිදුකරනු ලබන අතර ක්ෂේත්‍රය තුළ ඡන්ද හිමියන් ගණන් ගන්නා නිලධාරීන් ලෙස ග්‍රාම නිලධාරීවරුන් කටයුතු කරනු ලබයි.

සාමාන්‍යයෙන් පූර්ව ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනවල දී සෑම ගෘහයකටම ඡන්දහිමියන් ගණන් ගැනීමේ ආකෘතියක් (BC ආකෘතිය) බෙදා දී සංගණනයක් සිදුකරනු ලැබුවත්, රට තුළ වර්තමානයේ පවතින COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් පුරවැසියන්ගේ හා නිලධාරීන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව පිණිස 2021 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයේ දී, එසේ ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ආකෘති බෙදාදීමක් සිදු නොකිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කොට ඇත. ඒ වෙනුවට 2020 ඡන්ද හිමි නාමලේඛනයෙන් ඉවත් වන හා අලුතින් ඇතුළත් වන නම් ඇසුරින් පමණක් ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා 2021/ER නැමැති විශේෂ ආකෘතිය හඳුන්වා දී ඇත.

ඒ අනුව 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ඔබගේ නම ලියාපදිංචි කිරීමේ කටයුතු මතු දැක්වෙන අකාරයට සිදු කෙරේ.

- දිවයින තුළ පවතින Covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වර්ෂයේ දී පූර්වයෙහි මෙන් සෑම නිවසකටම ඡන්දහිමියන් ගණන් ගැනීමේ ආකෘතිය (BC) පත්‍ර බෙදාදීමක් සිදු නොකෙරෙන හෙයින් 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ඔබගේ නම ලියාපදිංචි වී තිබේදැයි යන්න www.elections.gov.lk වෙබ් අඩවියෙන් හෝ ග්‍රාම නිලධාරී කාර්යාලයෙන් පරීක්ෂා කර බැලිම කළ යුතු වේ.
- ඔබගේ නම 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි කොට තිබේ නම් සහ 2021 ජුනි 01 දින වන විට ඔබගේ පදිංචිය වෙනස් වී නොමැති නම් ඔබ විසින් කිසිදු අයදුම්පත්‍රයක් සම්පර්ණ කිරීමට අවශ්‍ය නොවේ. ඒ අනුව ඔබගේ නම 2020 ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ලිපිනයේ ම 2021 වර්ෂය සඳහා ද ලියාපදිංචි කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ලැබේ.

## පදිංචිය වෙනස් වීම හේතුකොටගෙන නව ලියාපදිංචිය සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය.

ඔබගේ සාමාන්‍ය පදිංචිය 2021 ජූනි මස 01 දිනට පෙර සංශෝධනය වී තිබේ නම් පමණක් 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ නව ලිපිනය යටතේ ලියාපදිංචි වීමට අවකාශය සලසා දී තිබේ. ඒ සඳහා ඔබ දැනට පදිංචි ලිපිනයට අදාල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයා හමුවී 2021/ER ආකෘති පත්‍රයක් ලබා ගෙන එය සම්පූර්ණ කර භාරදිය යුතු වේ. මෙම ආකෘතිය www.elections.gov.lk වෙබ් අඩවියෙන් ද බාගත කර හැකිය. මෙම ආකෘතියේ ඔබගේ පූර්ව ලියාපදිංචි විස්තර සඳහන් කිරීමට ඇති තීරුවෙහි එම විස්තර අනිවාර්යයෙන් සටහන් කිරීම කළ යුතු වේ. එසේම පූර්ව පදිංචි ස්ථානයෙන් පදිංචිය හැරයාමට අදාළව ග්‍රාම නිලධාරීවරයා විසින් නිකුත් කරන ලද ලිපිය ඉදිරිපත් කිරීම අනිවාර්යය නොවේ.

## 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වී නොමැත්තේ නම් එම තැනැත්තන් 2021 වර්ෂයේ දී ඡන්දහිමියෙක් වශයෙන් ලියාපදිංචි විය යුතු ආකාරය.

2020 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වී නොමැති තැනැත්තන් වර්තමානයේ පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරයා හමු වී 2021/ER ආකෘතියක් ලබාගැනීම හෝ මැතිවරණ කොමිෂන් සභාවේ www.elections.gov.lk වෙබ් අඩවියෙන් භාගත කොට එම ආකෘතිය නියමිත පරිදි සම්පූර්ණ කොට ග්‍රාම නිලධාරී වෙත භාර දිය යුතු වේ. මෙම ආකෘතියෙහි ඔබ අවසන් වරට ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිව සිටි ලිපිනයෙහි විස්තර සටහන් කිරීමට වගබලාගත යුතු වේ.

## 2021 වර්ෂයේ දී වයස අවුරුදු 18 සම්පූර්ණ වූ තැනැත්තන් ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි කිරීම.

2003.05.31 හෝ එදිනට පෙර උපන් තැනැත්තන්ට 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට හැකියාව පවති. ඒ අනුව මෙම වර්ෂයේ දී 18 සම්පූර්ණ වන තැනැත්තන් 2021/ER ආකෘතියක් සම්පූර්ණ කොට උප්පැන්න සහතිකයේ හා ජාතික හැඳුනුම්පතේ පිටපතක් සමඟ ග්‍රාම නිලධාරීවරයා වෙත භාර දිය යුතුවේ.

ඒ අනුව 2021 වර්ෂයේ ජන්හිමි නාමලේඛනයේ ලියාපදිංචිය සඳහා අදාළ ලියවිලි 2021.07.15 දිනයට පෙර ග්‍රාම නිලධරීවරයා වෙත භාරදිය යුතුව තිබිණි.

2021.09.14 දින සිට 2021.10.11 දින දක්වා ඡන්දහිමි නාමලේඛනයේ කෙටුම්පත ග්‍රාම නිලධාරී කාර්යාලවල, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ප්‍රදර්ශනය කරනු ලැබේ. එමෙන්ම www.elections.gov.lk වෙබ් අඩවියේ ද එම විස්තර ප්‍රදර්ශනය කරනු ඇත. මෙම ප්‍රදර්ශනය කරනු ලබන දින පිළිබඳ තොරතුරු ඉදිරියේ දී ප්‍රසිද්ධ දැන්වීම් මඟින් හා ඔබගේ ජංගම දුරකථනයට එවනු ලබන SMS පණිවිඩයක් මඟින් ද දැනුම් දීමට මැතිවරණ කොමිෂන් සභාව ක්‍රියා කරනු ඇත.

එමෙන්ම ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කිරීමට මාර්ගගත(Online) පහසුව ද මේ වන විට ලබා දී ඇති අතර ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියට පිවිස (www.elections.gov.lk) එහි සඳහන් කොට ඇති උපදෙස් පරිදි ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීමට පුළුවන.

## අ සහ ආ ලැයිස්තු කෙටුම්පත ප්‍රදර්ශනය කිරීම.

2021 ඡන්ද හිමි නාමලේඛනය සඳහා ඇතුළත්වීමට හා ඉවත්වීමට නිර්දේශ කරන ලද නම් ලැයිස්තුවල කෙටුම්පත 2021.08.16 දින සිට 2021.08.27 දින දක්වා ග්‍රාම නිලධාරී කාර්යාලවල, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල හා මැතිවරණ කොමිෂන් සභාවේ නිළ වේබ් අඩවියේ ප්‍රදර්ශනය කරනු ලබයි. යම් තැනැත්තෙකුගේ නම 2021 ඡන්ද හිමි නාමලේඛනය සඳහා ඇතුළත් වීමට නිර්දේශ වී නොමැති නම් ඒ සඳහා ඉල්ලීමක් 2021/ER ආකෘතියෙන් මෙම කාලය තුළ සිදු කළ හැකි ය.

## හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම.

මෙසේ ලැබෙන ඉල්ලීම් ද සලකා විධිමත් අ සහ ආ ලැයිස්තු 2021.09.14 දින සිට 2021.10.11 දින දක්වා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ප්‍රදර්ශනය කිරීම සිදුකරනු ලබයි. ඒ අනුව 2021 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට සුදුසුකම් සපුරා තිබෙන එහෙත් ඒ සඳහා නිර්දේශ වී නොමැති පුද්ගලයින්ට හිමිකම් ඉල්ලීම සඳහා 2021.08.21 දින සිට 2021.09.14 දින දක්වා පදිංචියට අදාළ මැතිවරණ කාර්යාලය වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු වේ.

එසේම සුදුසුකම් නොමැති තැනැත්තෙකුගේ නම කෙටුම්පත් ඡන්දහිමි ලැයිස්තුවට ඇතුළත් වී තිබේ නම් ඒ සඳහා ද විරෝධතාවක් නියමිත ආකෘතියෙන් දෙපිටපතකින් යුතුව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත මෙම කාලය තුළ දීම ඉදිරිපත් කළ හැකි ය.

ඒ අනුව මෙම සියළුම ව්‍යවස්ථාපිත කාර්යයන් අවසානයේ දී 2021 ඡන්දහිමි නාමලේඛනය 2021 වර්ෂය නිම වීමට පෙර සහතික කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් කටයුතු සම්පාදනය කර ඇත.

## මැතිවරණ කොට්ඨාස සහ පරිපාලන දිස්ත්‍රික්කය අනුව ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව

| මැතිවරණ කොට්ඨාශය හා පරිපාලන දිස්ත්‍රික්කය | ඡන්ද හිමියන් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 2020 | | 2019 | |
| කොළඹ | | 1,724,061 | | 1,709,209 |
| ගම්පහ | | 1,804,102 | | 1,785,964 |
| කළුතර | | 981,364 | | 972,319 |
| මහනුවර | | 1,140,168 | | 1,129,100 |
| මාතලේ | | 413,096 | | 407,569 |
| නුවරඑළිය | | 583,566 | | 577,717 |
| ගාල්ල | | 876,391 | | 867,709 |
| මාතර | | 664,030 | | 659,587 |
| හම්බන්තොට | | 499,586 | | 493,192 |
| යාපනය | | 563,193 | | 571,848 |
| යාපනය දිස්ත්‍රික්කය | 469,822 | | 479,584 | |
| කිලිනොච්චි දිස්ත්‍රික්කය | 93,371 | | 92,264 | |
| වන්නි | | 290,169 | | 287,024 |
| වවුනියාව දිස්ත්‍රික්කය | 123,785 | | 119,811 | |
| මන්නාරම දිස්ත්‍රික්කය | 85,948 | | 88,853 | |
| මුලතිව් දිස්ත්‍රික්කය | 80,436 | | 78,360 | |
| මඩකලපුව | | 419,345 | | 409,808 |
| දිගාමඩුල්ල | | 523,148 | | 513,979 |
| ත්‍රිකුණාමලය | | 293,607 | | 288,868 |
| කුරුණෑගල | | 1,360,627 | | 1,348,787 |
| පුත්තලම | | 628,640 | | 614,370 |
| අනුරාධපුර | | 701,827 | | 693,634 |
| පොළොන්නරුව | | 336,701 | | 331,109 |
| බදුල්ල | | 675,924 | | 668,166 |
| මොණරාගල | | 377,688 | | 372,155 |
| රත්නපුර | | 888,722 | | 877,582 |
| කෑගල්ල | | 690,101 | | 684,189 |
| **මුළු එකතුව** | **16,436,056** | | **16,263,885** | |

# ව්‍යවස්ථාවේ ගණිත ප්‍රශ්නය



**ආචාර්ය ජයන්ත සේනාධීර**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (ගණිත අංශය, විවෘත විශ්ව විද්‍යාලය)**
(උපුටාගැනීම - ''හපුතන්ත්‍රීගේ සුනිල් ගුණරත්න මානව හිතවාදී සොඳුරු ගණිතඥයා'' නම් කෘතියෙනි.)

සැහෙන කාලෙකට පස්සෙ අන්දරගමේ වැසියන්ට සතුටුදායක ආරංචියක් ලැබුණා. ගමේ ඉන්න ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීතුමා එදා ගමේ තිබෙන හැම කඩ පිලකටම ගොඩ වැදිලා ගම් වැසියන් හමුවෙලා වීරයා වගේ ප්‍රකාශ කළේ අලුත් සංවර්ධන ව්‍යාපෘතියකින් ගමට නළ ළිං 10ක් ලැබෙන බවයි. ඒ වාගේම එය තනිකරම තමන්ගේ උත්සාහයේ මහන්සියෙන් ගමට ලබා ගත් ප්‍රතිලාභයක් බවත් බොහොම උජාරුවෙන් පැවසුවා.

නියඟය කාලයට අන්දරගමේ වැසියන් වතුර හිඟකමින් බොහෝම පීඩා විඳිනවා. ඒ කාලයට ගමේ තිබෙන පොදු ළිං බොහෝමයක් සිඳී යන බැවින් ගම් වැසියන්ට බොන වතුර ලබාගැනීමටත් යෑමට සිදුවන්නේ කුඩාඔය ට වේ. කොහොම වුණත් මේ ආරංචිය මහා ඉඩෝරයකට පස්සේ වැටුණු මහ වරුසාවක් වගේ ගම් වැසියන්ගේ සිත් සතන් තුළට අස්වැසිල්ලක් ගෙන ආවා.

දැන් ඉතින් ඊළඟ ප්‍රශ්නය වුණේ මේ ළිං 10 ගම තුළ බෙදා ගන්නා ආකාරය ගැන තීරණය කිරීමයි. අන්දරගම ප්‍රධාන කොටස් 03කින් සමන්විතයි. ඒ ඉහළ අන්දරගම, පහළ අන්දරගම හා අන්දරගම ගොඩැල්ල යනුවෙනුයි.

ඉහළ අන්දරගමේ පවුල් 61ක් වාසය කරනවා. පහළ අන්දරගම පවුල් 61කුත් අන්දරගම ගොඩැල්ලේ පවුල් 21 කුත් වාසය කරනවා. මුලින්ම මේ ළිං 10 ගමේ මේ කොටස් තුනට බෙදා ගන්නා ආකාරය තීරණය කළ යුතුව තිබෙනවා.

මේ ගැන සාකච්ඡා කරන්න ගමේ ග්‍රාම සංවර්ධන සමිතිය ඊළඟ සති අන්තයේ රැස් කරන්න තීරණය කළා. ගමේ හැම පොදු වැඩක්ම සිදුකරන්නේ ගමේ ග්‍රාම සංවර්ධන සමිතිය හරහායි.

සති අන්තයේ පැවැත්වුණු ග්‍රාම සංවර්ධන සමිතියට එදා ගම්මු බොහොම උනන්දුවෙන් සහභාගී වුණා. රොම්බස් සීයාත් අන්දරගම ගොඩැල්ල නියෝජනය කරමින් සමිති රැස්වීමට ගියා. අන්දරගම ගොඩැල්ලේම පදිංචි පණ්ඩිතරත්න මහත්මයාත් ග්‍රාම සංවර්ධන සමිතියේ අනුශාසකවරයෙක් වශයෙන් කටයුතු කරනවා.

පණ්ඩිතරත්න මහත්මයා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ලිපිකරුවෙක් ලෙස දීර්ඝ කාලයක් සේවය කර විශ්‍රාම ලැබූවෙක්. මේ නිසා අන්දරගම පමණක් නොව අවට ගම්වල උදවිය පවා පණ්ඩිතරත්න මහත්මයාට ගරුසරුවක් දක්වනවා.

එදා ග්‍රාම සංවර්ධන සමිතියේ ප්‍රධානතම ප්‍රශ්නය වුණු නළ ළිං 10 ගමේ කොටස් තුන සඳහා බෙදා ගන්නා ආකාරය පිළිබඳව සාකච්ඡාව පටන් ගත්තා.

කාගේත් පොදු මතය වූයේ එක් එක් කොටසේ සිටින පවුල් සංඛ්‍යාවට සමානුපාතිකව නළ ළිං 10 කොටස් තුන අතරේ බෙදා ගතයුතු බවයි.

මේ අවස්ථාවේ නැඟී සිටි පණ්ඩිතරත්න මහතා ප්‍රකාශ කළේ එලෙස පවුල් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදන විට භාග සංඛ්‍යාද ලැබීමට ඉඩ ඇති බැවින් සහ ඒ අනුව නළ ළිං කොටස් කර දීමට නොහැකි බැවින් ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතු බවයි. ඒ සමඟම පණ්ඩිතරත්න මහතා ප්‍රකාශ කළේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උදව්වෙන් තමාට එයට විසඳුමක් ලබාදීමට හැකි බවයි. වැඩි දුරටත් ඔහු පැවසුවේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14වන පරිච්ඡේදයේ 98 අනු ව්‍යවස්ථාවේ මේ ආකාරයේම ගැටලුවක් වන එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනයට සමානුපාතිකව පාර්ලිමේන්තුවේ ආසන 160ක් බෙදන්නේ කෙසේද යන්න පිළිබඳව විධි විධාන ඇතුළත් වන බවයි.

ඒ අනුව දිස්ත්‍රික්ක වෙනුවට ගමේ කොටස් තුන ද පාර්ලිමේන්තු මන්ත්‍රී සංඛ්‍යාව වෙනුවට ළිං 10 ද ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව වෙනුවට පවුල් සංඛ්‍යාව ද ආදේශ කර ගත් විට මේ ප්‍රශ්නයට එම විධි විධානම අදාළ කර ගත හැකි බව පණ්ඩිතරත්න මහතා පෙන්වා දුන්නා.

තමා ළඟ දැන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇති බැවින් ඒ විධි විධාන සමිතියට දැන්ම ඉදිරිපත් කළ හැකි බව පණ්ඩිතරත්න මහතා දැනුම් දුන්නා. (සාමාන්‍යයෙන් පුරුද්දක් ලෙස පණ්ඩිතරත්න මහතා යන යන තැන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් රැගෙන යයි.) අනතුරුව ගම්මුන්ගේ ඉල්ලීම පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අදාළ විධිවිධාන පණ්ඩිතරත්න මහතා විසින් සභාව ඉදිරියේ කියවූවා. ඒ අනුව 98 (4), 98(5) සහ 98(6) විධිවිධාන ඉදිරිපත් කළා.

98 (4) සියලුම මැතිවරණ කොට්ඨාසවල ඡන්ද හිමි නාමලේඛනවල නම් දැක්වෙන මුළු ඡන්දහිමි සංඛ්‍යාවේ එකතුව එකසිය හැටෙන් බෙදිය යුත්තේය. එසේ බෙදීමෙන් ලැබෙන පූර්ණ සංඛ්‍යාව (ශේෂ වන භාග ගණන් නොගෙන) මෙහි මින් මතු 'පරිමිත සංඛ්‍යාව' යනුවෙන් සඳහන් කරනු ලැබේ.

98(5) එක් එක් මැතිවරණ කොට්ඨාසයේ ඡන්දහිමි නාමලේඛනයේ නම් ඇතුළත් වන ඡන්දහිමියන්ගේ මුළු සංඛ්‍යාව පරිමිත සංඛ්‍යාවෙන් බෙදිය යුතු අතර, ඒ මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමියන්ගේ මුළු සංඛ්‍යාව පරිමිත සංඛ්‍යාවෙන් බෙදූ විට ලැබෙන පූර්ණ සංඛ්‍යාවට සමාන මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් තෝරා පත් කිරීමට ඒ එක් එක් මැතිවරණ කොට්ඨාසයට හිමිකම් ඇත්තේ ය. තව ද ඒ ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව එසේ බෙදූ විට ශේෂයක් වේ නම්, ඒ ශේෂය සම්බන්ධයෙන්, අවශ්‍ය නම්, මේ ව්‍යවස්ථාවේ (6) වන අනුව්‍යවස්ථාවට අනුකූලව ක්‍රියා කළ යුත්තේ ය.

98(6) පරිමිත සංඛ්‍යාව අනුසාරයෙන් මේ ව්‍යවස්ථාවේ (5) වන අනුව්‍යවස්ථාවට අනුකූලව නිශ්චය කරන ලද, මැතිවරණ කොට්ඨාස සියල්ලෙන්ම තෝරා පත් කළ යුතු මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව එකසිය හැටකට අඩුවන අවස්ථාවක ඉතිරි මන්ත්‍රීධුර සංඛ්‍යාව සඳහා හිමිකම් මැතිවරණ කොට්ඨාස අතර බෙදා වෙන් කිරීම, ඉහත කී ඡන්ද හිමියන්ගේ ශේෂය ද (5) වන අනුව්‍යවස්ථාව යටතේ කරන ලද නිශ්චය අනුව යම් කිසි මැතිවරණ කොට්ඨාසයකට එක් මන්ත්‍රීවරයකුවත් තෝරා පත් කිරීමට හිමිකම් නොලැබෙන අවස්ථාවක ඒ මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාමලේඛනයේ නම් ඇතුළත් වන ඡන්ද හිමියන්ගේ මුළු සංඛ්‍යාව ද පදනම් කොට ගෙන කළ යුතු

අතර ඒ පදනම අනුව එසේ වැඩි ම ඡන්ද හිමියන්ගේ ශේෂයක් හෝ වැඩිම මුළු ඡන්දහිමි සංඛ්‍යාවක් හෝ සිටින මැතිවරණ කොට්ඨාසයට එක් වැඩිපුර මන්ත්‍රීවරයකු යනා දී වශයෙන්, තෝරාපත් කර ගත යුතු මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව එකසිය හැටක් වන තුරු, මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් තෝරා පත් කර ගැනීමට හිමිකම් ඇත්තේ ය.

මේ කරුණු කාරණා ගම්මුන් බොහොමයකට අපබ්‍රංශ වගේ දැනුණත් පණ්ඩිතරත්න මහත්මයාට ඇති ගරු සැලකිල්ල නිසාත් ව්‍යවස්ථාවේ සඳහන්ව ඇති දිස්ත්‍රික්කවල ඡන්ද හිමි සංඛ්‍යාවට සමානුපාතිකව ඒ ඒ දිස්ත්‍රික්කයට හිමි මන්ත්‍රීවරු සංඛ්‍යාව තීරණය කිරීම මෙම ළිං බෙදාගැනීමට සර්ව සම වූ ගැටළුවක් බව ගම් වැසියන්ට තහවුරු වූ බැවිනුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එම විධි විධාන භාවිතා කර ළිං බෙදා ගැනීමට ගම් වැසියෝ කැමැත්ත පළකර සිටියහ.

ඒ අනුව මුලින්ම මුළු ගමේම සිටින පවුල් සංඛ්‍යාව වන 61+61+21 = 143, බෙදා දිය යුතු ළිං සංඛ්‍යාව වන 10 න් බෙදුවා එවිට ලැබෙන පිළිතුර 14.3 ක් වනවා මේ අනුව 98(4) විධි විධානයේ සඳහන් ආකාරයට ශේෂ වන කොටස අතහැර පූර්ණ සංඛ්‍යාව වන 14 පමණක් ඉදිරි කටයුතුවලට භාවිතා කරනවා.

දැන්

$$\frac{61}{14} = 4.35, \quad \frac{61}{14} = 4.35, \quad \frac{21}{14} = 1.5$$

ඒ අනුව 98(5) පරිදි එක් එක් කොටසේ පූර්ණ සංඛ්‍යාවට සමාන ළිං සංඛ්‍යාවක් පළමු පියවරේ දී එක් එක් කොටසට ලබාදිය යුතුයි. ඒ අනුව ඉහළ අන්දරගමට සහ පහළ අන්දරගමට ළිං 4 බැගිනුත් අන්දරගම ගොඩැල්ලට එක ළිඳකුත් පළමු පියවරේ දී ලැබෙනවා. මේ අනුව තව එක ළිඳක් ඉතිරි වනවා 98(6) අනුව එම ළිඳ වැඩිම ශේෂය හිමි කොටසට ලැබෙනවා ඒ අනුව එය අන්දරගම ගොඩැල්ලට හිමි වෙනවා. අවසාන ප්‍රතිඵලය වන්නේ ඉහළ අන්දරගමට ළිං 4 ක් පහළ අන්දරගමට ළිං 4 ක් සහ අන්දරගම ගොඩැල්ලට ළිං 02 ක් වශයෙන් ළිං 10 බෙදී යාමයි.

කවුරුත් මේ සම්බන්ධයෙන් සතුටු වුණා. හැමෝම පණ්ඩිතරත්න මහත්මයාට ස්තුති කළා. ඒ විතරක් නෙමෙයි කාගේත් ඒකමතික යෝජනාවට අනුව මින් ඉදිරියට ගමට ලැබෙන ප්‍රතිලාභ ගමේ කොටස් තුන අතරේ බෙදා ගැනීමට සිදු වන්නේ නම් මෙම නීතිය අනුවම බෙදා ගැනීමට යෝජනාවක් ග්‍රාම සංවර්ධන සමිතියේ සභා සම්මත වුණා. අනතුරුව සභා තොමෝ සතුටින් විසිර ගියා. සති කිහිපයකට පස්සෙ පණ්ඩිතරත්න මහත්තයා රොම්බස් සීයාගේ කඩයට බොහොම උජාරුවෙන් ගොඩ වැදුනා. කඩපිලේ සිටි අයට පණ්ඩිතරත්න මහත්තයා පැවසුවේ තමාට ලැබුණු ආරංචිය අනුව ගමට නළ ළිං 10 ක් නොව 11ක්ම ලැබීමට නියමිත බවයි.

ඒ පිළිබඳව කඩපොළේ සිටි අන්දරගම ගොඩැල්ලේ ගැමියෝ සතුටු වුණා. ඒත් රොම්බස් සීයා පමණක් මෙසේ ප්‍රකාශ කළා.
'ගමට තව නළ ලිඳක් වැඩිවීම පිළිබඳව නම් සතුටු වෙන්න පුලුවන්. ඒත් අන්දරගම ගොඩැල්ලට නම් අවාසියක් වෙනවා. එදා සම්මත වුණු ක්‍රමය යටතේ මේ අළුත් තත්ත්වය සැලකිල්ලට ගත්තොත් අන්දරගම ගොඩැල්ලට ලැබෙන්නේ එක නළ ළිඳක් පමණයි.'

පණ්ඩිතරත්න මහත්මයා රොම්බස් සීයාගේ කථාවට කැමැත්තක් දැක්වූයේ නැහැ. ඔහු පැවසුවේ නළ ළිං 10 ක් බෙදන විට අන්දරගම ගොඩැල්ලට ළිං දෙකක් ලැබුණේ නම් නළ ලිං 11ක් බෙදන විට එක නළ ලිඳක් පමණක් හිමි වීමට කිසිම ඉඩක් නැති බවයි.

පණ්ඩිතරත්න මහත්මයා එතනින් නික්ම ගියේ මිනිසුන් නොමඟ නොයවන ලෙස රොම්බස් සීයාට අවවාදයක් ද ලබා දෙමිනුයි.

මාසෙකට විතර පස්සෙ අන්දරගමේ ග්‍රාම සංවර්ධන සමිතිය ආයෙත් රැස්වුණා. ලැබුණු ආරංචිය පරිදිම ගමට නල ළිං 10 ක් නොව 11 ක්ම ලැබෙන බව තහවුරු වී හමාරයි. කලින් වාරයේ සම්මත වුණු යෝජනාව අනුව මෙම අළුත් තත්ත්වය යටතේ වැඩිපුර ලැබෙන ළිඳ ලැබෙන්නේ කාටද යන්න දැනගැනීමට හැමෝම උනන්දු වුණා. ගමේ ඉස්කෝලෙ මහත්මයා කළු ලෑල්ලක හැමෝටම පෙනෙන පරිදි කලින් වතාවේ සම්මත කළ යෝජනාවට අනුව ළිං 11ක් මේ එක් එක් කොටසට බෙදෙන ආකාරය ගණනය කලා. ඒ අනුව මුලින්ම ගමේ මුළු පවුල් සංඛ්‍යාව 11න් බෙදුවා.

$$\frac{143}{11} = 13$$

දෙවන පියවර වශයෙන් එක් එක් කොටසේ පවුල් සංඛ්‍යාව 13න් බෙදුවා

$$\frac{61}{13} = 4.69, \quad \frac{61}{13} = 4.69, \quad \frac{21}{13} = 1.61$$

ඒ අනුව මුල් වටයේදී ඉහළ අන්දරගමට ළිං 4 ක්ද පහළ අන්දරගමට ළිං 4 ක්ද අන්දරගම ගොඩැල්ලට ළිං 1ක්ද වශයෙන් ලැබෙනවා. ඉතිරි ළිං දෙක පිළිවෙලින් වැඩිම ශේෂය සහිත කොටස් දෙකට හිමි වෙනවා.

දැන් ගණනය කිරීම් අනුව වැඩිම ශේෂය ඇත්තේ ඉහළ අන්දරගම සහ පහළ අන්දරගමටය. ඒ අනුව ඉතිරි ළිං දෙක ලැබෙන්නේ මේ කොටස් දෙකටයි. මේ නිසා අවසන් ප්‍රතිඵලය අනුව ඉහළ අන්දරගමට ළිං 05 ක් පහළ අන්දරගමට ළිං 05 ක් සහ අන්දරගම ගොඩැල්ලට ළිං 01 ක් ලෙස බෙදී යනවා.

රොම්බස් සීයා කිව්වා වගේම අළුත් තත්ත්වය අනුව අන්දරගම ගොඩැල්ලට ලැබෙන්නේ එක ළිඳක් පමණයි. හැමෝටම මේ ප්‍රතිඵලය පිළිබඳව පුදුමයි. පණ්ඩිතරත්න මහත්මයාත් කළුලෑල්ල ළඟට ගිහින් ගණනය කිරීම් ආයෙත් පරීක්ෂා කළා. නමුත් වැරැද්දක් නැති බව අවසානයේ සනාථ වුණා. කොහොම වුනත් ඉහළ අන්දරගම හා පහළ අන්දරගම ජනතාව සිටියේ සන්තෝශයෙන් ඔවුන් දෙගොල්ලන්ටම අළුතින් ළිඳ බැගින් වැඩි වන බැවින්. නමුත් අන්දරගම ගොඩැල්ලේ අය නම් සිටියේ හරිම කනස්සල්ලෙන්.

මීට පෙර ප්‍රතිලාභ බෙදාගන්නා ආකාරය පිළිබඳ සම්මත කර ගත් යෝජනාව අහෝසි කරන ලෙස අන්දරගම ගොඩැල්ලේ නියෝජිතයින් ඉල්ලා සිටියා. නමුත් ඉහළ අන්දරගම හා පහළ අන්දරගම ඊට කැමති වුනේ නැහැ. ඔවුන් විශේෂයෙන්ම මතක් කළේ එම යෝජනාව සකස් කළේත් අන්දරගම ගොඩැල්ලේම පදිංචි පණ්ඩිතරත්න මහතා බවයි.

අන්තිමේදී අන්දරගම ගොඩැල්ලට හිමි වුණේ එක නළ ළිඳක් පමණයි. අන්දරගම ගොඩැල්ලේ බොහෝමයක් දෙනා එවර නම් පණ්ඩිතරත්න මහතාගේ පණ්ඩිතකම විවේචනය කළා.

(ඒ ඒ දිස්ත්‍රික්කවලට ආදාළව ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව අනුව එක් එක් දිස්ත්‍රික්කයට හිමිවන මන්ත්‍රීවරුන් සංඛ්‍යාව ගණනය කිරීමේ දී මෙවැනි තත්ත්වයක් උදාවිය හැකි බැවින් එවැනි සිදුවීම් වළක්වා ගැනීම සඳහා ව්‍යවස්ථා සම්පාදකයන් වගබලා ගත යුතු වේ.)

# ශ්‍රී ලංකාවේ
# මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීම හා ඊට අදාළ ප්‍රධාන මූලධර්ම ක්‍රියාත්මක කිරීම


**ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක**
(ශ්‍රී ලංකා මහා බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපති හා සීමා නිර්ණය කොමිෂන් සභාවේ හිටපු සාමාජික)




මෙම ලිපියේ පළමු කොටස පසුගිය කලාපයේ පළ කර ඇත. මෙහි පළ වන්නේ එහි II වන හා අවසන් කොටසය. මෙම ලිපිය මඟින් සීමා නිර්ණය පිළිබඳ ප්‍රධාන මූලධර්ම ඉතා වැදගත් වන්නේ මන්ද? එම මූලධර්ම වඩාත් ඵලදායී ලෙස උපයෝගී කරගත හැක්කේ කෙසේද? යන කරුණු සාකච්ඡා කිරීමට යත්න දැරේ. මෙහිදී ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන මූලධර්ම අවධාරණය කෙරේ. ඒවා නම්,

01. **ජනගහණය හා ඉඩම්:**
    - රටෙහි එක් එක් සීමා මායිම් තුළ ජීවත්වන සියලුම ජනගහණය හා සෑම පුරවැසියකුගේම අවශ්‍යතා හඳුනා ගැනීම.
    - සීමා මායිම් තුළට ගැනෙන සම්පූර්ණ භූමි ප්‍රමාණය, ඒ තුළ පවත්නා භූමි විෂමතාවන් හා ඊට ඇතුළත් සියලුම පාරිසරික සම්පත් සුරක්ෂිත කිරීමේ අවශ්‍යතාව හඳුනා ගැනීම.

02. **පූර්ණාවරණය හා නියෝජනය:**
    - සෑම පුද්ගලයෙකුගේම අභිවෘද්ධිය හා
    - සෑම ඉඩම් කොටසකම සංරක්ෂණය යන කාරණා කෙරෙහි සම සාධාරණ වීම.

03. **අපක්ෂපාතීබව:**
    - කිසිදු උපජන කොට්ඨාසයකට හෝ
    - කිසිදු බිම් කොටසකට පක්ෂග්‍රාහී නොවීම. රටේ බහුජන භාවය හා එහි ජීවත්වන ජනතාවගේ බහු සංස්කෘතික විවිධත්වය සීමා නිර්ණයේ දී සැලකිල්ලට ගැනීම. සම සාධාරණ නියෝජනයේ ලක්ෂණ කිසිවකුට හානියක් නොවන පරිදි මෙම විවිධාකාර කණ්ඩායම්වල අවශ්‍යතාවන් හැකි උපරිම ප්‍රමාණයෙන් සාධනය වීම. භූමිය සම්බන්ධයෙන් ද එය එලෙසින්ම අදාළ වේ.

04. **දත්ත අනුකූලතාව: ජනගහණ සංඛ්‍යා හා භූමිය යන අංශ දෙක සම්බන්ධයෙන් මුලු දිවයිනටම සංසන්දනය කළ හැකි ආකාරයේ දත්ත සමුදායක් පදනම් කරගැනීම.**

පසුගිය ලිපියේ සඳහන් කරනු ලැබූ ආකාරයට තොරතුරු එක් රැස් කිරීම, පරිපාලනය, සේවා සැපයීම හෝ පුරවැසි නියෝජිතයන් තෝරාපත්කර ගැනීම යන කවර හෝ කරුණක් අරභයා වුව ද සීමා නිර්ණයක් සිදුකරන අවස්ථාවක එය මෙම මූලධර්මවලට අනුකූලව සිදු කළ යුතු ය.

දැනට පවත්නා නීති අනුව පාර්ලිමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන යන මට්ටම් තුනෙහිම මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණ ක්‍රියාවලියේ ආරම්භය වනුයේ පවත්නා පරිපාලන දිස්ත්‍රික්ක වේ. පාර්ලිමේන්තු හා පළාත් සභා මැතිවරණවල දී නියෝජිතයන් තෝරා පත්කර ගැනීමේ මැතිවරණ කොට්ඨාස සීමා මායිම් පවතින්නේ දිස්ත්‍රික්කයක් තුළ ය. පළාත් පාලන මැතිවරණ සම්බන්ධයෙන් වූ කළ එක් එක් පළාත් පාලන ආයතනය දිස්ත්‍රික්කයක් තුළ පිහිටා ඇති අතර, ඒ ඒ පළාත් පාලන ආයතනය සඳහා නියෝජිතයන් පත්කර ගැනීමේ දී එම ආයතනයේ මැතිවරණ කොට්ඨාසය සීමා මායිම් ලෙස සැලකෙනුයේ එම පළාත් පාලන ප්‍රදේශවල සීමාවන්ය.

*1 වගුව:* **ජනගහන හා භූමි ප්‍රමාණය (දිස්ත්‍රික් අනුව)**

| පළාත | දිස්ත්‍රික්කය | ජනගහණය (2012 ජන සංගණනය) | භූමි ප්‍රදේශ | ජන ඝනත්වය (ව.කි.මී. පුද්ගලයන්) |
|---|---|---|---|---|
| බස්නාහිර | කොළඹ | 2,324,349 | 676 | 3,447 |
| | ගම්පහ | 2,304,833 | 1,341 | 1,723 |
| | කළුතර | 1,221,948 | 1,576 | 777 |
| මධ්‍යම | මහනුවර | 1,375,382 | 1,917 | 720 |
| | මාතලේ | 484,531 | 1,952 | 249 |
| | නුවරඑළිය | 711,644 | 1,706 | 419 |
| දකුණු | ගාල්ල | 1,063,334 | 1,617 | 659 |
| | මාතර | 814,048 | 1,270 | 643 |
| | හම්බන්තොට | 599,903 | 2,496 | 241 |
| උතුරු | යාපනය | 583,882 | 929 | 630 |
| | මන්නාරම | 113,510 | 1,880 | 53 |
| | වවුනියා | 99,570 | 1,861 | 93 |
| | මුලතිවු | 172,115 | 2,415 | 38 |
| | කිලිනොච්චිය | 92,238 | 1,205 | 95 |
| නැගෙනහිර | මඩකලපුව | 526,567 | 2,610 | 202 |
| | අම්පාර | 649,402 | 4,222 | 154 |
| | ත්‍රිකුණාමලය | 379,541 | 2,529 | 151 |
| වයඹ | කුරුණෑගල | 1,618,465 | 4,624 | 351 |
| | පුත්තලම | 762,396 | 2,882 | 265 |
| උතුරු මැද | අනුරාධපුර | 860,575 | 6,664 | 130 |
| | පොළොන්නරුව | 406,088 | 3,077 | 132 |
| ඌව | බදුල්ල | 815,405 | 2,827 | 289 |
| | මොණරාගල | 451,058 | 5,508 | 82 |
| සබරගමුව | රත්නපුර | 1,088,007 | 3,236 | 137 |
| | කෑගල්ල | 840,648 | 1,685 | 500 |
| එකතුව | | 20,359,439 | 62,705 | 326 |

නිවැරදි දැක්මක් ඇති සෑම මහජන නියෝජිතයෙකුගේම මූලික අරමුණ වන්නේ තම මැතිවරණ කොට්ඨාස සීමාවන් තුළ ජීවත්වන සෑම පුරවැසියෙකුගේම ජීවන තත්වය නඟා සිටුවීම හා සෑම බිම්කඩක්ම සංරක්ෂණය කිරීම බව මාගේ විශ්වාසයයි. මෙම දැක්ම යටතේ සෑම පුරවැසියෙකුටම සම

සාධාරණ ලෙස නියෝජනය වන බව තහවුරු විය යුතු ය. සීමා නිර්ණය ක්‍රියාවලිය වූ කලි සමහරුන් විශ්වාස කරන පරිදි යම් යම් දේශපාලන පක්ෂවල බලය හා වරප්‍රසාද සුරක්ෂිත කිරීමේ මාර්ගයක් නොව ජනතාවගේ හා භූමියේ අවශ්‍යතාවන් උපරිම ලෙස තහවුරු කිරීමේ මාර්ගයක් වේ.

අරමුණුගත ජන කණ්ඩායම්වල ට (ජාතිය හෝ ආගම අනුව සුළුතරය වූ, ස්ත්‍රී මූලික ගෘහවාස, ආබාධිත වැනි කණ්ඩායම්) සෙසු ජන කොටස් සමග සාමයෙන් හා සමාදානයෙන් ජීවත් වීමට ඉඩ සැලසීම, ආපදාවලට ගොදුරුවිය හැකි (විශේෂ නොහැකියාවන් සහිත, ළදරු හෝ වයෝවෘද්ධ) පුද්ගලයන් සඳහා සෞඛ්‍ය හා සුභසාධනය සැලසීම, පාසල්වල පහසුකම් හා ඒවාහි ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය රැකදීම, රැකියා අවස්ථා සැලසීම හා ආර්ථික කටයුතු, වාණිජ කර්මාන්ත හා කෘෂිකාර්මික කටයුතු සඳහා වූ යටිතල පහසුකම් සැලසීම, ගංවතුර, පාංශුඛාදනය, නායයෑම් හා වෙනත් ස්වභාවික ආපදා වලින් ආරක්ෂාවීම සඳහා අවශ්‍ය පාරිසරික ආරක්ෂාව සැලසීම වැනි කාරණා සම්බන්ධයෙන් දිවයිනේ ඒ ඒ ප්‍රදේශවල පවත්නා විවිධ අවශ්‍යතාවන් නියෝජනය කළ හැකි ආකාරයේ මැතිවරණ සීමා මායිම් සකස්කොට දීමට සීමා නිර්ණය ක්‍රියාවලිය සමත්විය යුතු ය.

කවර රටක වුව ද දැකිය හැකි ආකාරයටම ශ්‍රී ලංකාවේ ද දිස්ත්‍රික්ක 25 අතර ජනගහණය හා භූමි ප්‍රදේශ ප්‍රමාණයන්හි බොහෝ වෙනස්කම් දක්නට ලැබේ. සෑම විට ම මෙවැනි වෙනස්කම් පැවතීම ස්වභාවිකය. ඇතැම් ප්‍රදේශවල ජනතා සුභසිද්ධිය සැලසීම කෙරෙහි වැඩි සැලකිල්ලක් අවශ්‍ය වන අතර තවත් සමහර ප්‍රදේශවල අවශ්‍යවන්නේ භූ සම්පත සංරක්ෂණය කිරීම සඳහා විය හැකි ය. වඩාත් නාගරීකරණය වූ (කොළඹ, ගම්පහ වැනි) දිස්ත්‍රික්කවල කුඩා ප්‍රදේශයන්හි පවා විශාල ජනගහණයක් ජීවත් වෙති. ග්‍රාමීය (අනුරාධපුර හා මොණරාගල වැනි) දිස්ත්‍රික්කවල කුඩා ජනගහන ප්‍රමාණයන් ජීවත් වන අතර ඒවායෙහි වනාන්තර, ජලය හා කෘෂිකර්ම යනාදියෙන් පොහොසත් වූ විශාල බිම් ප්‍රදේශ පිහිටා තිබේ. මෙම විවිධත්ව කෙරෙහි නිසි අවධානයෙන් යුතුව ඉහත දැක්වුණු ප්‍රධාන මූලධර්මයන් ක්‍රියාත්මක කළ යුතු වේ. එම මූලධර්ම දැනට පවත්නා නීතිරීතිවල පහත විස්තර කෙරෙන ආකාරයට අන්තර්ගත වී තිබේ.

## මැතිවරණ කොට්ඨාස සීමා මායිම් නිර්ණය කිරීමේ ක්‍රියාවලියේ දී සලකා බැලෙන ප්‍රධාන සාධක.

*01.* **දිස්ත්‍රික්කයක් තුළ ජීවත් වන සෑම පුරවැසියෙකුගේම ඡන්දය දීමේ ශක්තිය එක සමාන බව තහවුරු කිරීම:** මෙයින් පූර්ණාවරණය ද නියෝජන ශක්තිය සහ අපක්ෂපාතී බවද පෙන්නුම් කෙරේ. දිස්ත්‍රික්කයක ජනගහනය පිළිබඳව සලකන කළ ඡන්ද බලය ලැබිය හැකි වයස් ප්‍රමාණයට අඩු ජනතාව හා ඡන්ද බලය හිමි වයස් ප්‍රමාණය ඇති ජනතාව යන දෙකොට්ඨාසයම ඇතුළත් ය. කෙසේ වුව ද වැඩිහිටියෝ(ඡන්ද බලය හිමි වයසේ පුද්ගලයෝ) නොමේරූ (ඡන්ද බලය හිමි වයසට නොපැමිණි පුද්ගලයන්) පුද්ගලයන්ගේත් තමන්ගේත් අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටිති.

එබැවින් නියෝජනය වන ජනගහනයේ පදනම ඡන්ද බලය ඇති ජනතාව පමණක් නොව මෙම සම්පූර්ණ ජනගහනයම බව සැලකිය යුතු වේ. සමාන නියෝජනයක් තහවුරු කිරීම සඳහා දිස්ත්‍රික්කයකින් (පළාත් පාලන ආයතනයකින්) තේරීපත්වන නියෝජිතයෙකුට සමාන ජනගහනයක් වෙන්කර දීම අරමුණු කොටගෙන ක්‍රියාකිරීම සීමා නිර්ණය ක්‍රියාවලියක දී වැදගත් වේ. දිස්ත්‍රික්කයක (පළාත් පාලන ආයතනයක) සියලුම මැතිවරණ කොට්ඨාස සඳහා එක සමාන උප ජනගහන ප්‍රමාණයක් බැගින් වෙන්කර දීම ප්‍රායෝගික වශයෙන් දුෂ්කර කාර්යයකි. එබැවින් එක් නියෝජිතයෙකු සඳහා වන ජනගහන ප්‍රමාණය (සම්පූර්ණ ජනගහනය තෝරා පත්කර ගනු ලබන නියෝජිතයන්ගේ සංඛ්‍යාවෙන් බෙදූ විට ලැබෙන ජනගහන ප්‍රමාණය) තීරණය කළ පසු, නොවැළැක්විය හැකි කුමන වෙනස්කමකට හෝ ඉඩදීම සඳහා ධාරිතා මට්ටමක් (එක් නියෝජිතයෙකුට 5% - 10% කට අඩුවැඩි ජනගහන ප්‍රමාණයක් යයි සිතමු) පූර්ව නිශ්චය කර ගැනීමෙන් දිස්ත්‍රික්කයක (පළාත් පාලන ආයතනයක) උද්ගත විය හැකි විසමානුපාතික භාවය අවම කිරීමට (තෝරාගනු ලබන නියෝජිතයන් අතර ජනගහනය බෙදීම සාධාරණ වන බව තහවුරු කිරීමට) සීමා නිර්ණය ක්‍රියාවලිය මගින් පියවර ගත යුතු ය. මෙම මූලධර්මය 2017 අංක 17 දරණ පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පණතේ 3 අ (4) (ආ) (1) හි අන්තර්ගත වේ.

*02.* **දිස්ත්‍රික්කයක දැනට පවත්නා (අ) භූගෝලීය ලක්ෂණ හා (ආ) පරිපාලන දිස්ත්‍රික්ක මායිම් හඳුනාගැනීම:** සීමා නිර්ණය ක්‍රියාවලිය මගින් (අ) විවිධ ප්‍රදේශවල පවත්නා විශේෂිත වූ පාරිසරික කාරණා හා (ආ) දිස්ත්‍රික්කය තුළ පවත්නා පරිපාලන ක්‍රියාවලීන්හි සාධාරණභාවය පිළිබඳව හේතු යුක්ත ලෙස සැලකිය යුතු වේ. සීමා නිර්ණයක් මගින් කිසියම් මැතිවරණ කොට්ඨාස මායිමකට ඇතුළත් වන ජනතාවට තම නියෝජිතයන් කරා එළඹීමේ අවස්ථාව මෙන්ම තේරී පත් වූ නියෝජිතයාට තම මැතිවරණ කොට්ඨාසය තුළ සිටින ඡන්ද දායකයින් කරා එළඹීමේ අවස්ථාව ද සලස්වාදිය යුතු ය. මේ සඳහා සෑම පදිංචිකරුවෙකුටම ජල භූමි, ඇළ දොළ, කඳුහෙල් වැනි ස්වභාවික සීමා මායිම් හඳුනාගනිමින් පහසුවෙන් ප්‍රවේශවිය හැකි මාර්ග තිබිය යුතු වේ. ඒ අනුව දිස්ත්‍රික්කයේ භෞතික හැඩය, සබැඳියාව හා සංයුක්ත බව, මාර්ග ජාලය හා ප්‍රවාහනය, සන්නිවේදන ජාලයන් හා භෞතිකමය වශයෙන් හැඳින්වෙන ස්වභාවික ජන කණ්ඩායම් හරිහැටි හඳුනාගත් සන්තතික භූමි ප්‍රදේශයක් මැතිවරණ සීමා මායිමකට තිබීම අවශ්‍ය වේ. මෙම මූලධර්මය 2017 අංක 17 දරණ පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පණතේ 3 අ (4) (ආ) (ii) වගන්තියෙහි අන්තර්ගත වේ. උදාහරණයක් වශයෙන් කන්දක හෝ ගැඹුරු දිය කඳුරක එක් පැත්තක වාසය කරන පුරවැසියන්ට තම මහජන නියෝජිතයා හමුවීමට එම කන්දේ හෝ කඳුරේ අනෙක් පැත්තට යාමට සිදුවීම අපේක්ෂා නොකළ යුත්තකි. එබැවින් මහජන නියෝජිතයන්ද ඒ ඒ පැතිවල සිටිය යුතු ය. තවද ශ්‍රී ලංකාවේ සියලුම ජනගහන තොරතුරු සපයනු ලබන්නේ ඉතාම කුඩා පරිපාලන ඒකකය වන ග්‍රාම නිලධාරි කොට්ඨාස අනුවය. එබැවින් සීමා නිර්ණයේ දී මෙම ග්‍රාම නිලධාරි කොට්ඨාස පදනම් කොට ගත යුතු ය. මැතිවරණ සීමා මායිම් සකස් කිරීමේ දී නොබෙදා හැකි තරම් දුරට ඒකාබද්ධ කිරීම ප්‍රායෝගික වශයෙන් වැදගත් වේ. දිස්ත්‍රික්ක තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, ග්‍රාම නිලධාරි කොට්ඨාස අනුව ඒකාබද්ධ වන හෙයින් හැකිතරම් දුරට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමා සුරක්ෂිත කිරීම වඩාත් සුදුසු ය. කෙසේ වුව ද අවස්ථානුගත වෙනත් කාරණා හේතුකොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බෙදීමක් සිදුකළ යුතු වන්නේ නම් සමීපස්ථ ග්‍රාම නිලධාරි කොට්ඨාස එකට පවත්නා ආකාරයට මැතිවරණ සීමා සකස් කළ යුතු ය.

වගුව 2 : **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරි කොට්ඨාස (දිස්ත්‍රික්ක අනුව)**

| පළාත | දිස්ත්‍රික්කය | ජනගහණය (2012 ජන සංගණනය) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව | ග්‍රාම නිලධාරි කොට්ඨාස සංඛ්‍යාව |
|---|---|---|---|---|
| බස්නාහිර | කොළඹ | 2,324,349 | 13 | 557 |
| | ගම්පහ | 2,304,833 | 13 | 1,177 |
| | කළුතර | 1,221,948 | 14 | 762 |
| මධ්‍යම | මහනුවර | 1,375,382 | 20 | 1,188 |
| | මාතලේ | 484,531 | 11 | 545 |
| | නුවරඑළිය | 711,644 | 5 | 491 |
| දකුණු | ගාල්ල | 1,063,334 | 19 | 895 |
| | මාතර | 814,048 | 16 | 650 |
| | හම්බන්තොට | 599,903 | 12 | 576 |
| උතුරු | යාපනය | 583,882 | 15 | 435 |
| | මන්නාරම | 113,510 | 4 | 95 |
| | වවුනියා | 99,570 | 5 | 153 |
| | මුලතිවු | 172,115 | 4 | 102 |
| | කිලිනොච්චිය | 92,238 | 6 | 136 |
| නැගෙනහිර | මඩකලපුව | 526,567 | 14 | 346 |
| | අම්පාර | 649,402 | 20 | 503 |
| | ත්‍රිකුණාමලය | 379,541 | 11 | 230 |
| වයඹ | කුරුණෑගල | 1,618,465 | 30 | 1,610 |
| | පුත්තලම | 762,396 | 16 | 548 |
| උතුරු මැද | අනුරාධපුර | 860,575 | 22 | 694 |
| | පොළොන්නරුව | 406,088 | 7 | 295 |
| ඌව | බදුල්ල | 815,405 | 15 | 567 |
| | මොණරාගල | 451,058 | 11 | 319 |
| සබරගමුව | රත්නපුර | 1,088,007 | 17 | 575 |
| | කෑගල්ල | 840,648 | 11 | 573 |
| එකතුව | | 20,359,439 | 331 | 14,021 |

03. **දිස්ත්‍රික්කයක් තුළ විශේෂ බැඳීම් ඇති ජන කොට්ඨාස හඳුනා ගැනීම** : කිසියම් දිස්ත්‍රික්කයක (අ) පොදු වාර්ගික හෝ ජනවාර්ගික පසුබිම (ආ) පොදු ඓතිහාසික හෝ සංස්කෘතික කරුණු (ඇ) පොදු ආගම (ඈ) පොදු භාෂාව (ඉ) පොදු සමාජ ආර්ථික හෝ ආදායම් තත්ත්ව (ඊ) පොදු ආර්ථික කටයුතු (උ) පොදු පුම්තිරිභාවය හෝ වෙනත් විශේෂිත කාරණා මත බහුතර ජනගහණයට වඩා වෙනස් වන ජන කොට්ඨාස පිළිබඳව සීමා නිර්ණය ක්‍රියාවලියේ දී නිසි අවධානය යොමුකළ යුතු ය. මෙම මූලධර්ම 2017 අංක 17 දරණ පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පණතේ 3 අ (4) (අ) වගන්තියෙහි අන්තර්ගත වේ. දිස්ත්‍රික්කයේ ජන කොට්ඨාසය ඝනීභූත වී ඇති අකාරයට අනුව කුමන නියෝජිත ආයතනයක ට වුව ද සාධාරණ නියෝජනය ලබා ගැනීමට ඉඩ සැලසිය යුතු ය.

උදාහරණයක් වශයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ වෙරළ තීරයේ ජීවත්වන ජනතාව ප්‍රධාන වශයෙන් වෙළදාම් හා ව්‍යාපාරික කටයුතුවල නිරතවන අතර කලපුවෙන් මෑත අභ්‍යන්තර භූමියේ වාසය කරන ජනතාව කෘෂිකාර්මික කටයුතුවල යෙදෙති. එබැවින් ඔවුන්ගේ අවශ්‍යතාවන් එකිනෙකට වෙනස් ය. ඒ අනුව වඩාත්ම උචිත ක්‍රමය වන්නේ ඔවුන්ට තම අවශ්‍යතාවන්ට සරිලන නියෝජිතයන් පත්කර ගැනීමට ඉඩ ලබා දීම ය. ඒ ආකාරයටම, පොදු ආගමික, වාර්ගික හා සංස්කෘතික කරුණු අනුව එකට බැඳුණු, එහෙත් බහුතර ජනතාව අතර සුළු ජන කොටස් ලෙස ජීවත්වන ජන කොට්ඨාසවලට ඉහත (1) හා (2) හි දැක් වූ සීමාවන්ට යටත්ව, තම අවශ්‍යතා සපුරාගත හැකිවන ආකාරයට භූගෝලීය වශයෙන් කණ්ඩායම්ගත වෙමින් තම නියෝජිතයින් පත්කර ගැනීමට හැකිවීම ඔවුන්ගේ මනා දිවිපැවැත්මට උපකාරී වනු ඇත.

04. **දත්ත අනුකූලතාව**: කුමන රටක වුව ද සීමා නිර්ණය ක්‍රියාවලියකට උපයෝගී කරගත යුතු වන්නේ ඉතාම මෑතක පවත්වන ලද ජනගහණය හා ඉඩම් පිළිබඳව සිදු කරන ලද ජාතික සංගණනයෙන් එක්රැස් කරන ලද තොරතුරුය. එමගින් දත්තවල අනුකූලතාව හා ඒවා රැස් කිරීමේ ක්‍රියාදාමයේ අපක්ෂපාතී බව තහවුරු කෙරේ. තොරතුරු එක්රැස් කිරීමට යෙදූ විධික්‍රම හා ඒවා රැස් කිරීමේ යාන්ත්‍රණය පක්ෂපාතීයැයි මතුවිය හැකි සැකය මේ නිසා උද්ගත නොවේ.ඓතිහාසික වශයෙන් ශ්‍රී ලංකාවේ ද සෑම සීමා නිර්ණයක්ම පාදක කොටගෙන ඇත්තේ ඊට පෙරාතුවම පැවතුණු ජන සංගණනයෙන් ලද තොරතුරුය. සමහර අවස්ථාවල සිදුකර තිබූ සංගණනය හා නව සීමා නිර්ණය අතර කාලය තුළ විවිධ කරුණු නිසා (නියගය, ජල ගැලීම්, සිවිල් යුද්ධ, රැකියා අවස්ථා දුලභවීම) ජනගහණය රට තුළට හා රටින් පිටතට සංක්‍රමණය වී සිටිය හැකිය. එබඳු විටක ජනගහණ තොරතුරු හා භූමියේ යථා තත්වය නොගැලපෙන්නට ඉඩ තිබේ. එසේ තිබිය දී අපක්ෂපාති ජාතික සංගනණයෙන් බැහැරව විවිධ මූලයන් මගින් රටේ විවිධ පළාත්වල අනනුකූල විග්‍රහ කිරීම් යටතේ එක්රැස් කරන ලද තොරතුරු (උදා: දිස්ත්‍රික් ලේකම්වරු 25 දෙනෙකු වෙන වෙනම එක්රැස් කළ තොරතුරු) උපයෝගීකර ගැනීමෙන් සම්පූර්ණ සීමා නිර්ණය ක්‍රියාවලියම බලවත් අනනුකූලතාවකට පත්වීමට ඉඩ තිබේ.

මැනවින් ස්ථාපනය කරන ලද ප්‍රතිපත්ති රාමුවක් තුළ, නිසි මූලධර්ම පද්ධතියක් අනුව පත්වනු ලබන ඵලදායී මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණයක් මගින් මහජනතාව තුළ මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ විශ්වාසය ගොඩනැංවීමෙහිලා දිගු ගමනක් යා හැකි ය. එසේම ජනතාවගේ සුභ සිද්ධිය උදෙසාත්, අපගේ පරිසරය සුරක්ෂිත කර ගැනීම උදෙසාත්, ශ්‍රී ලංකාවේ අනාගත දේශපාලනයට අවශ්‍ය ධෛර්යමත් හා දූරදර්ශී නායකත්වයක් ගොඩ නැගීම සඳහා තරුණ තරුණියන් ආකර්ශනය කර ගැනීම ද මෙමගින් ඉටුකරගත හැකි ය.

## මැතිවරණ නීති සංශෝධනය සඳහා පත් කරන ලද පාර්ලිමේන්තු තේරීම්කාරක සභාව

මැතිවරණ නීති සංශෝධනය පිණිස පත් කරන ලද පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවේ සභාපතිවරයා වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී හා පාර්ලිමේන්තුවේ සභානායක ගරු දිනේෂ් ගුණවර්ධන මහතා පත්කොට ඇති අතර සෙසු සමාජිකයන් වශයෙන් ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා, ගරු(මහචාර්ය)ජී.එල්. පීරිස් මහතා, ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය, ගරු ඩග්ලස් දේවානන්දා මහතා, ගරු විමල් වීරවංශ මහතා, ගරු එම්.යූ.එම්.අලි සබ්රි මහතා, ගරු ජීවන් තොන්ඩමන් මහතා, ගරු අනුර දිසානායක මහතා, ගරු කබීර් හෂීම් මහතා, ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා, ගරු මනෝ ගනේෂන් මහතා, ගරු එම්.ඒ.සුමන්තිරන් මහතා, ගරු මධුර විතානගේ මහතා, ගරු සාගර කාරියවසම් මහතා පත් කොට ඇති අතර එම කාරක සභාවේ ලේකම්වරිය ලෙස පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම් කුෂානි රෝහණධීර මහත්මිය කටයුතු කරයි. 2021.05.17 දින දී මෙම කාරක සභාවේ නිල කටයුතු ආරම්භ කොට ඇති අතර මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් ද අවස්ථාවෝචිත පරිදි කාරක සභාවට සහාය වීම සඳහා එහි පැවැත්වෙන සාකාච්ඡා සඳහා සහභාගී වේ. දේශපාලන පක්ෂ විසින් යෝජනා 26ක් ද සිවිල් සංවිධාන, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන හා පුද්ගලික වශයෙන් යෝජනා 126ක් ද තේරීම් කාරක සභාවට ලැබී තිබේ. මෙම වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ දී මෙම කටයුතු අවසන් කිරීම තේරීම්කාරක සභාවේ අපේක්ෂාවයි.



බැලුවාම
වැරදි ළකුණක් වගේ
පෙණුනාට
නුඹ තරම්
වටිනා කිසිවක් නොමැත
අද රටට

මැති ඇමතිතට
සේම ජනපතිට
අගමැතිට......?

ඔය පුංචි එකට එක කැපීගිය
ඉරි කෑලි දෙක ඉෂ්ඨ කරන්නේ
ඕනෑම දේශයක
ලොකුම ලොකු කාරියයි

හැක නුඹට
රටක් වුව පෙරලන්ට
මහා පුටු බිමලන්ට
ඕනෑම දේශයක්
බලුවෙන් හිටවන්නට

**දඹේගොඩ ජිනදාස**
වැල්ලවාය


මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා, සමාජිකයන් ඇතුළු නිලධාරීන් මල්වතු අස්ගිරි මහනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ දෙනම බැහැදැක ආශිර්වාද ලබාගත් අවස්ථාව.


මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා, සමාජිකයන් ඇතුළු නිලධාරීන් අනුරාධපුර අටමස්ථානාධිපති ස්වාමීන් වහන්සේ හා මිහින්තල රජමහා විහාරාධිපතීන් වහන්සේ බැහැදැක ආශිර්වාද ලබාගත් අවස්ථාව


මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා, සමාජිකයන් ඇතුළු නිලධාරීන් අතිගරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් හමු වූ අවස්ථාව


ප්‍රධාන කාර්යාලයේ පැවති ගී රස වින්දන වැඩසටහන


සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරු සමඟ පැවැත් වූ විශේෂ හමුව


ශ්‍රී ලංකාවේ රුසියානු තානාපති යූරි මැටරි මහතා සමඟ පැවැත් වූ සුහද හමුව


ග්‍රාම නිලධාරි සංගම්වල නියෝජිතයන් සමඟ පැවැත් වූ විශේෂ හමුව


USAID සංවිධානය සමඟ පැවැත් වූ විශේෂ හමුව


**උපදේශක මණ්ඩලය**
නීතිඥ නිමල් ජී. පුංචිහේවා - සභාපති
එස්. බී. දිවාරත්න - සමාජික
කේ.පී.පී. පතිරණ - සමාජික
එම්.එම් මොහොමඩ් - සමාජික
ජීවන් ත්‍යාගරාජා - සමාජික
සමන් ශ්‍රී රත්නායක - මැතිවරණ කොමසාරිස් ජනරාල්
එච්.එම්.ටී.ඩී. හේරත් - ලේකම්
රසික පීරිස් - අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)



**සංස්කාරක** - චන්න පී. ද සිල්වා (අධ්‍යක්ෂ, පර්යේෂණ හා ක්‍රම සම්පාදන)
**පරිගණක පිටු සැකසුම** - අමිල ගමගේ
**මුද්‍රණය** - රජයේ මුද්‍රණාලය
**ප්‍රකාශනය** - පර්යේෂණ හා සැලසුම් අංශය
මැතිවරණ කොමිෂන් සභාව


**ඔබගේ අදහස් හා යෝජනා අපට ලියන්න**


සංස්කාරක - කතිරයේ බලය
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
02, සරණ මාවත,
රාජගිරිය,
ශ්‍රී ලංකාව.

(+94)0112868441-42-43
(+94)112868426
info@elections.gov.lk
www.elections.gov.lk
SriLankaElectionCommission
elecomsl
Election Commission of Sri Lanka
Election Commission of Sri Lanka



ISSN-2706-0047



මෙම සඟරාවේ ලිපිවල සඳහන් කරුණු පිළිබඳව වගකීම ඒ ඒ ලේඛකයා සතු වන අතර, ලිපිවල ඇතුළත් කරුණුවලින් මැතිවරණ කොමිෂන් සභාවේ හෝ මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ හෝ අදහස් ප්‍රකාශ නොවේ.